රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 11/99

මගේ අංකය :- ආ/III/3/17-1
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1999.05.20

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන ලේකම්වරුන්
හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**<u>දේපල ණය සඳහා ඇපකරුයන් ආයතන සංග්‍රහයේXXIV</u>**
**<u>පරිච්ඡේදයට සංශෝධනය</u>**

1997.01.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/97 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛයේ 2(II) හි සඳහන් පරිදි ණය සුරැකුම් රක්ෂණය සඳහා දායක වී ඇති නිලධාරීන්ට එම චක්‍රලේඛයේ 3 වන ජේදයේ සඳහන් 3 වන ඇමුණුම පරිදි ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයට පහත සඳහන් උප වගන්ති එකතු කිරීමෙන් ආයතන සංග්‍රහය සංශෝධනය කරනු ලැබේ.

7:4:1 අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ ණය සුරැකුම් රක්ෂණය සඳහා දායක වී ඇති නිලධාරියකු සම්බන්ධ වන කළ, 7:4 හි සඳහන් පරිදි ඇපකරුවන් ඉදිරිපත් කිරීම වෙනුවට විකල්පයක් ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/97 විධිවිධාන අනුව එකී රක්ෂණ සහතිකය ඇපයක් ලෙස ඉදිරිපත්කළ හැකිය.

8:4:1 ඉහත 7:4:1 හි විධිවිධාන අදාළ කර ගත හැක.

10:4:1 ඉහත 7:4:1 හි විධිවිධාන අදාළ කර ගත හැක.

12:6:1 ඉහත 7:4:1 හි විධිවිධාන අදාළ කර ගත හැක.

02. මෙම විධිවිධාන 1997.01.31 දින සිට බලපැවැත්වෙනු ඇත.

**පී.ඒ.සේනාරත්න**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය